ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
ලංකා විදුලිබල මණ්ඩලය

**ජාත්‍යන්තර මට්ටමින් තරඟකාරී ලංසු කැඳවීම (ICB)**

**මෙගා වොට් 30ක (1-5 MW, AC ප්‍රමාණයේ) පොළොව මත සවිකර ඇති/පාවෙන සූර්ය ප්‍රකාශ වෝල්ත විදුලි බලාගාර ස්ථාපනය කිරීම සඳහා ඉදිකිරීම, අයිතිය සහ පවත්වා ගෙන යාම (Build, Own and Operate) යන පදනම යටතේ වසර 20 ක කාල සීමාවක් තුල පවත්වාගෙන යාම සඳහා යෝජනා කැඳවීම**

**අංකය - TR/RED&PM/ICB/2020/004/C**

යෝජනා භාර ගැනීමේ අවසන් දිනය සහ වේලාව - **2022 ඔක්තෝබර් 27** වන දින **පෙ.ව. 10.00**

1. පොළොව මත සවිකර ඇති/පාවෙන සූර්ය ප්‍රකාශ වෝල්ත විදුලි බලාගාර ඉදිකර එමඟින් සැපයෙන සූර්ය බල උත්පාදනය මගින් ජාතික විදුලිබල පද්ධතිය වෙත විදුලිය සැපයීම සඳහා ව්‍යාපෘතිය ඉදිකිරීම්, අයිතිය සහ පවත්වාගෙන යාම යන පදනම යටතේ වසර 20 ක කාල සීමාව තුල පවත්වාගෙන යාම සඳහා පිළිගත් ව්‍යාපෘති යෝජකයන් වෙතින් **මෙ.වො. 30ක**, **AC** ධාරිතාවයකට පහත සඳහන් ග්‍රිඩ් උපපොළවල් සඳහා යෝජනා ලංකා විදුලිබල මණ්ඩලය මගින් ජාත්‍යන්තර මට්ටමින් තරඟකාරී ලංසු කැඳවීම (ICB) තුලින් කැඳවනු ලැබේ. **එක් බලාගාරයක ස්ථාපිත ධාරිතාවය 1 MW,AC සිට 5 MW,AC දක්වා වේ**.

| ග්‍රිඩ් උපපොළ | උපරිම ධාරිතාවය |
|---|---|
| බෙලිඅත්ත | 2 MW,AC |
| මාතර | 10 MW,AC |
| නාවලපිටිය | 3 MW,AC |
| පල්ලෙකැලේ | 7 MW,AC |
| වවුනතිව් | 8 MW,AC |
| **එකතුව** | **30 MW,AC** |

2. යෝජනා ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජකයන් විසින් පහත සඳහන් අවශ්‍යතාවයන් ඉටු කල යුතුය.

    අ) ව්‍යාපෘතියේ සැලසුම් සම්පාදනය, මූල්‍ය කටයුතු, මිලදී ගැනීම්, ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කල යුතුය.

    ආ) ව්‍යාපෘතියෙහි අවශ්‍යතාවය පරිදි අවශ්‍ය ඉඩම් මිලදී ගැනීම හෝ කල්බදු ක්‍රමයට ලබා ගැනීම කල යුතුය (ඉදිරිපත් කර ඇති යෝජනා සලකා බැලීමේදී එම යෝජනා සමඟ එවන ලද ලේඛන සත්‍ය ලේඛන බවට තහවුරු කිරීම සඳහා, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට ඉදිරිපත් කර ලියාපදිංචි වූ ලේඛන ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ).

    ඇ) සූර්ය ප්‍රකාශ වෝල්ත විදුලි බලාගාරය අදාල ග්‍රිඩ් උපපොල වෙත සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය රැහැන් මග, තරාපැවි, විදුලි ආරක්ෂණ පද්ධති, විදුලි මණු ආදිය සඳහා වන සියළු වියදම් දැරිය යුතුය.

    ඈ) ව්‍යාපෘතියට අදාලව අවශ්‍ය වන සියළු පාරිසරික අනුමැතීන්, රාජ්‍ය ආයතන වල අනුමැතීන් හා ව්‍යවස්ථාපිත බලපත්‍ර ආදිය ලබා ගත යුතුය.

    ඉ) එම සූර්ය ප්‍රකාශ වෝල්ත විදුලි බලාගාරය සඳහා ලං.වි.ම. සමග බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කල යුතු අතර විදුලිය මිලදී ගැනීම සඳහා එම ගිවිසුම වානිජ මෙහෙයුම් ආරම්භ කරන දිනයේ සිට වසර 20 ක කාලයක් සඳහා වලංගු වේ. අදාල ග්‍රිඩ් උපපොළට මුදාහරින විදුලි බලශක්ති ප්‍රමාණය (Energy) මත පමණක් පදනම්ව විදුලි මිලදී ගැනීම් සිදු කෙරේ.

3. එක් ව්‍යාපෘති යෝජකයකුට ඉහත සඳහන් ග්‍රිඩ් උප පොළයන්හි බලාගාර ඕනෑම ප්‍රමාණයක් සඳහා ග්‍රිඩ් උප පොළ උපරිම ධාරිතාව නොඉක්මවන කොන්දේසියට යටත්ව යෝජනා ඉදිරිපත් කල හැකි අතර සෑම යෝජනාවක් සඳහාම වෙන වෙනම යෝජනා කැඳවීම් ලේඛන (Request for Proposal Document) මිලදී ගත යුතුය. ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සමග පහත ලිපිනයෙහි පිහිටා ඇති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුන.බ.ප්‍ර. හා කා.අ.) ශාඛාව වෙත පැමිණ නැවත නොගෙවන **රු.150,000/- ක** ගාස්තුවක් මුදලින් හෝ '**සාමාන්‍යාධිකාරී - ලංකා විදුලිබල මණ්ඩලය**' නමට ලියන ලද බැංකු අණකරයක් මගින් ගෙවීමෙන් වැඩ කරන දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 02.00 දක්වා කාලය තුල ලබා ගත හැක.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුන.බ.ප්‍ර. හා කා.අ.) ශාඛාව,
ලංකා විදුලිබල මණ්ඩලය,
නො. 6-1/2, පළමු මහල,
සුලෙයිමාන් ඇවනියු හරහා,
කාලිංග පෙදෙස,
කොළඹ 00500

දු.ක. +94 11 2583344 / 2504203 දු.ලි. +94 11 2583344 ඊ-මේල් dgmredpm@ceb.lk

යෝජනා කැඳවීම් ලේඛන (Request for Proposal Document) **2022 ඔක්තෝබර් 26** දින **පෙ.ව. 10.00** දක්වා ලබා ගත හැකිය.

මෙම ලියකියවිලි ලං.වි.ම. වෙබ් අඩවියෙන්ද (http://www.ceb.lk/tender-notice/en) පරීක්ෂා කළ හැක.

4. යෝජනා කැඳවීමේ ලේඛන පිළිබඳ සියළු විමසීම් ඉහත ලිපිනයෙහි සඳහන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුන.බ.ප්‍ර. හා කා.අ.) වෙතින් සිදු කළ හැක. යෝජනා කැඳවීමේ ලේඛන ඉල්ලා ලිඛිත ඉල්ලීමක් ඉහත ලිපිනය වෙත යොමු කිරීම මගින් ඒවා සීඝ්‍රගාමී බෙදාහැරීම් සේවය (Courier Service) මගින් ගෙන්වා ගත හැක. ඒ සඳහා ලිඛිත ඉල්ලීම සමග නැවත නොගෙවන, '**සාමාන්‍යාධිකාරී - ලංකා විදුලිබල මණ්ඩලය**' නමට ලියන ලද රු.150,000/- ක බැංකු අණකරයක් (දේශීය බෙදාහැරීම් සඳහා) හෝ ඇමෙරිකානු ඩොලර් 420 ක මුදලක් විදේශීය බෙදාහැරීම් සඳහා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුන.බ.ප්‍ර. හා කා.අ.) වෙත ඊ-මේල් මඟින් කරන ලිඛිත ඉල්ලීමක් සමඟ නැවත නොගෙවන ඇමෙරිකානු ඩොලර් 420 ක මුදලක් ලංකා විදුලිබල මණ්ඩලයේ පහත ගිණුමට බැර කරන ලද විස්තර පත්‍රිකාවක්) 2022 ඔක්තෝබර් 26 දින පෙ.ව. 10.00 ට පෙර එවිය යුතුය. බෙදා හැරීමේදී සිදුවන ප්‍රමාද වීම් හෝ අස්ථානගතවීම් සම්බන්ධයෙන් ලං.වි.ම. වග කියනු නොලැබේ.

Recipient: General Manager, Ceylon Electricity Board
Address: 50, Sir Chittampalam A. Gardiner Mawatha, Colombo 02, Sri Lanka
Account No. : 204100130085135
SWIFT Code: PSBKLKLX
Bank name: People's Bank,Head Office
Bank address: 75, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
Reference: TR/REP&PM/ICB/2020/004/C

5. යෝජනා කැඳවීමේ ලේඛනයෙහි උපදෙස් හා කොන්දේසි වලට අනුකූලව සකස් කර ගන්නා ලද සියළුම යෝජනා 2022 ඔක්තෝබර් 26 වන දින දක්වා පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 කාලය තුල ඉහත 3 කොටසේ සඳහන් ලිපිනයෙහි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුන.බ.ප්‍ර. හා කා.අ.) කාර්යාලය වෙත හෝ 2022 ඔක්තෝබර් 27 වන දින පෙ.ව. 10.00 ට පෙර ඉහත 3 කොටසේ සඳහන් ලිපිනය වෙත භාර දිය යුතුය.

2022 ඔක්තෝබර් 27 වන දින පෙ.ව. 10.00 ට පසු භාරදෙන යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

යෝජනා භාර ගැනීමේ දිනය සහ වේලාව පසු වූ විගස භාරදෙන ලද යෝජනා ව්‍යාපෘති යෝජකයින් හෝ බලයලත් නියෝජිතයන් ඉදිරියේ විවෘත කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය,
සභාපති,
අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙනුවට